# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 2171635 — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1048 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 23/06/2024 පැය 0540

**මාධ්‍ය නිවේදනය**

<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. මනුෂ්‍ය ඝාතනයක් - කටුවන පොලිස් වසම.**

2024.06.23 වන අද දින අළුයම් කාලයේ කටුවන පොලිස් වසමේ අමුදමන ප්‍රදේශයේදී පුද්ගලයෙකුට තියුණු ආයුධයකින් පහරදී ඝාතනය කර ඇති බවට කටුවන පොලිස් ස්ථානය වෙත ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත. **මරණකරු වයස අවුරුදු 41ක් වන අමුදමන, කටුවන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු හා ඔහුගේ මස්සිනා අතර ඇතිවූ අමනාපයක් මත බහින් බස්වීමක් දුරදිග යාමෙන් මස්සිනා විසින් තියුණු ආයුධයකින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය කටුවන රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා කටුවන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අනුරාධපුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.06.22 වන දින දහවල් කාලයේ අනුරාධපුර පොලිස් වසමේ බණ්ඩාරනායක මාවත ප්‍රදේශයේදී අනුරාධපුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 40 මිලිග්‍රෑම් 250 ක් සන්තකයේ තබාගෙන සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන අනුරාධපුර පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනුරාධපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දෙමටගොඩ පොලිස් ස්ථානය.**

2024.06.22 වන දින රාත්‍රී කාලයේ දෙමටගොඩ පොලිස් වසමේ 213 වත්ත ප්‍රදේශයේදී දෙමටගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 225 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වන දෙමටගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දෙමටගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - තලංගම පොලිස් ස්ථානය.

2024.06.22 වන දින සවස් කාලයේ තලංගම පොලිස් වසමේ කිඹුලාවල හන්දිය අසලදී තලංගම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 400 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන බොරැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තලංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කැළණිය කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.

2024.06.22 වන දින දහවල් කාලයේ වත්තල පොලිස් වසමේ ඇවරිවත්ත ප්‍රදේශයේදී කැළණිය කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 300 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වත්තල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන කොටුගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වත්තල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය.

2024.06.22 වන දින උදෑසන කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ නව කැළණි පාලම ප්‍රදේශයේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 130 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන සේදවත්ත, වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය.

2024.06.22 වන දින සවස් කාලයේ දෙහිවල පොලිස් වසමේ ඕබන් පෙදෙස ප්‍රදේශයේදී බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 930 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන දෙහිවල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 64 ක් වන දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දෙහිවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2024.06.22 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන බණ්ඩාරගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**09. විදේශ රටක නිෂ්පාදිත පිස්තෝල අවියක්, එම පතරොම් සහ හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2024.06.22 වන දින සවස් කාලයේ දී ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 02 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත. සැකකරුගෙන් කරන ලද ප්‍රශ්න කිරීමේදී ඔහු කුලී පදනම මත පදිංචි පැපිලියාන ප්‍රදේශයේ පිහිටි නිවසේ සඟවා තිබියදී **විදේශ රටක නිෂ්පාදිත පිස්තෝල වර්ගයේ ගිනි අවියක්, මිලිමීටර් 09 පතරොම් 10 ක්** සොයා ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 51 ක් වන පොල්ගස්ඕවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**10. විදේශ රටක නිෂ්පාදිත ජීව අත්බෝම්බයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - හුංගම පොලිස් ස්ථානය.**

2024.06.22 වන දින සවස් කාලයේ දී හුංගම පොලිස් වසමේ හැඩවින්න ප්‍රදේශයේදී හුංගම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **විදේශ රටක නිෂ්පාදිත ජීව අත්බෝම්බයක් සන්තකයේ තබාගෙන සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 20 ක් වන අම්බලන්තොට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හුංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**11. ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - හොරණ පොලිස් ස්ථානය.**

2024.06.22 වන දින සවස් කාලයේ හොරණ පොලිස් වසමේ මල්බෙරිගම ප්‍රදේශයේදී හොරණ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් පෙරීමට ගන්නා ගෝඩා ලීටර් 1650 ක් (බැරල් 10) සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48 ක් වන පෝරුවදණ්ඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හොරණ පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**12. ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කිරිඳිවැල පොලිස් ස්ථානය.**

2024.06.22 වන දින සවස් කාලයේ කිරිඳිවැල පොලිස් වසමේ මීතිරිගල ප්‍රදේශයේදී කිරිඳිවැල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් පෙරීමට ගන්නා ගෝඩා ලීටර් 1431 ක් (බැරල් 08) සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන මීතිරිගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කිරිඳිවැල පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**13. බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවන් හය දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මස්කෙළිය කඳවුර.**

2024.06.22 වන දින රාත්‍රී කාලයේදී බගවන්තලාව පොලිස් වසමේ මාඑළිය රක්ෂිත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා මස්කෙළිය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවන් හය දෙනෙකු මැණික් ගැරීමට උපයෝගී කර ගත් උපකරණ සමග අත්අඩංගුවට ගෙන බගවන්තලාව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 20, 24,26 36,39 හා 44 යන වයස්වල පසුවන බගවන්තලාව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

බගවන්තලාව පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**14. මාරක රිය අනතුරක් - මාතලේ පොලිස් වසම.**

2024.06.22 වන දින උදෑසන කාලයේදී මාතලේ පොලිස් වසමේ මහනුවර යාපනය මාර්ගයේ කෝන්ගහමුල ප්‍රදේශයේ දී දඹුල්ල දෙස සිට මාතලේ දෙසට ධාවනය කල පුද්ගලික බස් රථයක් මාර්ගය අයිනේ නවතා තිබූ ලංගම බස් රථයකට ඉස්සර කිරීමට යාමේදී ඉදිරියෙන් පැමිණි ත්‍රිරෝද රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ ත්‍රිරෝද රථයේ රියදුරු, ත්‍රිරෝද රථයේ පිටුපස ගමන්කළ රියදුරුගේ පියා, මව සහ නැගණිය මාතලේ රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී රියදුරුගේ මව සහ නැගණිය මියගොස් ඇත.

**මරණකාරියන් අවුරුදු 57 හා 17 වයස්වල පසුවූ මීගම්මන උතුර, වත්තේගම ප්‍රදේශයේ පදිංචිකාරියන් වේ.**

මෘත ශරීර මාතලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. බස් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර, මාතලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**15. මාරක රිය අනතුරක් - හම්බේගමුව පොලිස් වසම.**

2024.06.22 වන දින සවස් කාලයේදී හම්බේගමුව පොලිස් වසමේ ලහිනාගල දම්වැල්ඕඩය මාර්ගයේ ලහිනාගල ප්‍රදේශයේදී දම්වැල්ඕඩය දෙස සිට ලහිනාගල දෙසට ධාවනය වූ යතුරුපැදියක පදිකයෙකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික පුද්ගලයා කල්තොට රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා බලංගොඩ රෝහලට මාරුකර යවා එහි ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 73ක් වූ දම්වැල්ඕඩය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය බලංගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. යතුරුපැදියේ පැදිකරුද තුවාල ලබා හම්බේගමුව රෝහලේ ප්‍රතිකාර ලබන අතර හම්බේගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**16. මාරක රිය අනතුරක් - හලාවත පොලිස් වසම.**

2024.06.22 වන දින අළුයම් කාලයේ හලාවත පොලිස් වසමේ පැලියගොඩ පුත්තලම ප්‍රධාන මාර්ගයේ ජයබිම ප්‍රදේශයේදී පුත්තලම දෙස සිට පැලියගොඩ දෙසට ධාවනය වූ බස් රථයක ඊට ඉදිරියෙන් ධාවනය වූ අත්ට්‍රැක්ටරයක පිටුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් අත්ට්‍රැක්ටරයේ ගමන් ගත් මගීන් 10 දෙනෙකු හා රියදුරු තුවාල ලබා හලාවත රෝහලට ඇතුලත් කිරීමේදී එක් කාන්තාවක් මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 58 ක් වන පහල ගිරිබාව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය හලාවත රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර බස් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. හලාවත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**17. මාරක රිය අනතුරක් - අනුරාධපුරය පොලිස් වසම.**

2024.06.22 වන දින සවස් කාලයේ අනුරාධපුරය පොලිස් වසමේ අනුරාධපුරය රඹෑව ප්‍රධාන මාර්ගයේ පරසන්ගස්වැව ප්‍රදේශයේදී රඹෑව දෙස සිට අනුරාධපුරය දෙසට ධාවනය වූ යතුරුපැදියක් දකුණු පස ඇති අතුරු මාර්ගයකට හැරවීමට යාමේදී ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි ලොරි රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදියේ පැදිකරු හා පසුපැදිකරු තුවාල ලබා රඹෑව රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී පසුපැදිකරු මියගොස් ඇත. පැදිකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා අනුරාධපුරය රෝහලට මාරුකර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 57 ක් වන පරසන්ගස්වැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අනුරාධපුරය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ලොරි රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. අනුරාධපුරය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**